# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1887/15 - 2014 නොවැම්බර් මස 04 වැනි අඟහරුවාදා - 2014.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (xii).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, මේ නියමය මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත කලින් කල සංශෝධිත අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ, 1996 මාර්තු මස 27 වැනි දින හා අංක 916/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය සහ අවසන් වරට 2012 දෙසැම්බර් මස 05 වැනි දින අංක 1787/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් සංශෝධිත, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමය එහි II වන උපලේඛනයේ "පීඨය" යන ශීර්ෂය යටතේ වූ I වන තීරයේ සඳහන් "කළමනාකරණ සහ වාණිජ පීඨය" යන අයිතමයට අනුරූප වන්නා වූ "අධ්‍යයන අංශය" යන ශීර්ෂය යටතේ වූ II වන තීරයේ (ආ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"(ඇ) කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය.".

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

11 - 519


1A - PG 2237 — 505 (2014/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*